# ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා සමකාලීන සිංහල ව්‍යවහාරය

කේ.වී.ඩී. ලක්ෂාණි[1]

සමකාලීන සිංහල භාෂාවේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ප්‍රකට වන්නේ කෙසේ ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා භාෂාව පිළිබඳ අධ්‍යයනය භාෂාවේ ස්වරූපය ඔස්සේ සමාජය හඳුනා ගැනීමටත් සමාජය ඔස්සේ භාෂාව පිළිබඳ හැදෑරීමටත් වඩාත් වැදගත් වන විෂය ක්ෂේත්‍රයකි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය පර්යේෂණ මේ වන විට ලෝකයේ බහුලව කතා බහට ලක් වී ඇති යල් පැන ගිය විෂය ක්ෂේත්‍රයක් ලෙස සැලකුණ ද ලාංකීය සමාජයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා භාෂාව අතර සම්බන්ධය අධ්‍යයනයක් මෙතෙක් වී නොමැත. එසේ හෙයින් සිංහල භාෂාව මගින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ප්‍රකට වන්නේ කෙසේ ද යන්න මෙහි දී අධ්‍යයනය කෙරේ.

සිංහල භාෂාවේ භාෂණය හා ලේඛනය යන ද්විරූපතාව ම සැලකිල්ලට ගනිමින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව භාෂාව ගොඩ නැගී ඇත්තේ කෙසේ ද යන්න විමසා බැලෙන අතර තායි, යනා, කොසාති වැනි භාෂා ඇසුරින් වෙනත් භාෂක සමාජයන්හි සිදු කළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී පර්යේෂණ තොරතුරු ද මීට දායක කර ගැනේ.

තායි, යනා, කොසාති ආදි භාෂාවල ස්ත්‍රීන්ගේ හා පුරුෂයන්ගේ භාෂණයේ පැහැදිලි වෙනසක් දැකිය හැකි වුවත් සිංහල භාෂාවේ ස්ත්‍රිය වෙනත් භාෂාවකුත් පුරුෂයා වෙනත් භාෂාවකුත් ව්‍යවහාර කිරීම වැනි ලක්ෂණ ප්‍රකට නොවන බව නිරීක්ෂණයට ලක් වූ තොරතුරු ඇසුරින් පැහැදිලි කෙරේ. සිංහල භාෂාවේ දී එලෙස ස්ත්‍රී-පුරුෂ වශයෙන් විසමතා හමු වන්නේ ඔවුන්ගේ උච්චාරණ විලාසයන්හි සහ භාෂණයේ යෙදෙන මාතෘකා ආදියේ දී පමණකි.

අන්තර් ස්ත්‍රී සංකථන, අන්තර් පුරුෂ සංකථන සහ අන්තර් ස්ත්‍රී-පුරුෂ සංකථන නිරීක්ෂණ ඇසුරින් මේ බව සනාථ කරනු ලැබේ. මෙම සංවාදයන්හි ස්ත්‍රිය යටපත් වෙමින් පුරුෂයා ඉස්මතු වන අවස්ථා, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අධ්‍යයන්හි යොදා ගනු ලබන මතු දැක්වෙන න්‍යායාත්මක ප්‍රවේශ ඔස්සේ හඳුනාගත හැකිය.

---

[1] සිංහල අංශය, කොළඹ විශ්වවිද්‍යාලය
Email: laskvd@gmail.com

1. හිඟ ප්‍රවේශය ( Deficit Approach )
2. මතු වීමේ න්‍යාය ( Dominance Approach )
3. වෙනස් ප්‍රවේශය ( Difference Approach )

භාෂණයේ මෙන් ම ලේඛනයේ ද පුරුෂ මූලික ව භාෂාව නිර්මාණය වී ඇති ආකාරය සිංහල භාෂාවේ ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග නාම පද කෙරෙහි අවධානය යොමු කරන විට පැහැදිලි වේ.

එමෙන් ම භාෂා ව්‍යවහාරයේ දී ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශ්වය ම නියෝජනය කෙරෙන නාම පද පුරුෂ මූලික වන බව ද ඇතැම් නාම පදවල ස්ත්‍රී ලිංග රූපයක් නොමැති බවද පෙන්වා දෙන ස්ත්‍රීවාදී තර්ක විභාග කර බැලීම ද මෙහි සිදු වේ.

සිංහල භාෂාවේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ප්‍රකට වන ආකාරය අධ්‍යයනයේ දී, බෙහෝ අවස්ථාවල පුරුෂ මූලික බව ඉස්මතු වන ආකාරය මෙම පර්යේෂණයෙන් පැහැදිලි කරනු ලබයි. එහෙත් භාෂාවක් නිර්මාණය වීමේ දී එයට ස්ත්‍රී හෝ පුරුෂ මූලයක් තිබිය යුතු බව ද මෙහි දී තවදුරටත් පැහැදිලි කෙරේ. ස්ත්‍රිය හා පුරුෂයාගේ සමාජභාවයන් භාෂාවෙන් ප්‍රකට වන්නා සේ ම භාෂාව භාවිත කරමින් ඔවුන් තම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ගොඩනගා ගන්නා බව මෙම අධ්‍යයනයෙන් සොයා ගැනුණු නව දැනුම ලෙස සැලකිය හැකිය.

ප්‍රමුඛ පදඃ සිංහල භාෂාවේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය

**Title:** Gender: Modern Sinhala Language- A Socio Linguistic Study

**Keywords:** Modern Sinhala Language, Gender, Linguistics